MINISTERO DELL'INTERNO

euaa EUROPEAN UNION AGENCY FOR ASYLUM

# රැකවරණ දේශසීමා ක්‍රියාපටිපාටිය අතරතුර පිළිගැනීම තුළ ඔබේ අයිතිවාසිකම් සහ වගකීම්



**මෙම තොරතුරු ඔබ සඳහායි :**

- ඔබ වැඩිහිටියෙක් (වයස අවුරුදු 18 ට වැඩි) නම්
- ඉතාලිය හි ජාත්‍යන්තර ආරක්ෂාව ( රැකවරණය ලෙසද හැඳින්වේ) සඳහා ඉල්ලුම් කර ඇත්නම් සහ ඔබ දැන් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු නම්


## පටුන


| | |
|---|---|
| පිළිගැනීම යනු කුමක්ද? | 3 |
| ඔබ නැවතී සිටින්නේ කොහේද? | 6 |
| ඔබට ලැබෙන්නේ මොනවාද? | 7 |
| සෞඛ්‍ය සේවා සඳහා අයිතිය | 8 |
| දරුවන්ට අධ්‍යාපනයට ඇති අයිතිය | 11 |
| භාෂා පාඨමාලා සහ වෘත්තීය පුහුණුව | 12 |
| ඔබ කොතැනක නැවතී සිටියත්, ඔබට ඇති වෙනත් අයිතීන් මොනවාද? | 13 |
| අයදුම්කරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථා | 14 |
| ඔබට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද? | 15 |
| ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද? | 16 |
| බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබ වෙනත් EU+ රටකට ගමන් කළහොත් කුමක් සිදුවේද? | 17 |
| ඔබට අධිකාරියේ තීරණයකට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය | 18 |
| ඔබට නීතිමය සහාය ලැබිය හැකිය | - |
| සම්බන්ධතා තොරතුරු | - |

## පිළිගැනීම යනු කුමක්ද?

බලධාරීන් ඔබේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර අයදුම්කරුවෙකු ලෙස ඔබට ලැබෙන සහාය පිළිගැනීම වේ. මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිලි කර ඇති පිළිගැනීමේ අයිතීන් සහ වගකීම් එයට ඇතුළත් වේ.ඉතාලියේදී, භාරගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු ආයතනය වන්නේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය - සිවිල් නිදහස සහ ආගමන කටයුතු දෙපාර්තමේන්තුව - ප්‍රාදේශීය පරිපාලන කාර්යාලය /- ප්‍රාදේශීය රජයේ කාර්යාලය වන අතර, ඔබගේ රැකවරණ අයදුම්පත ( පරීක්ෂා කිරීමේ බලයලත් ආයතනය වන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව පිළිගැනීම සඳහා වන ප්‍රාදේශීය කොමිසමයි.

මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු ඔබට ලැබුණු බව තහවුරු කර අත්සන් කරන ලෙස කාර්ය මණ්ඩලය ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. යමක් පැහැදිලි නැත්නම් හි කාර්ය මණ්ඩලයෙන් ප්‍රශ්න අසන්න.



**ඔබ මෙම රට තුළ ආරක්ෂිතයි.**

ඔබ නැවතී සිටින කාලය තුළ, කාර්ය මණ්ඩලය ඔබේ තත්ත්වය අනුව ඔබට ලබා ගත හැකි පිළිගැනීමේ සේවාවන් සහ සහාය පිළිබඳව ඔබට දැනුම් දෙනු ඇත.



ඔබට වෙනත් සංවිධානවලින් තොරතුරු සහ උපකාර නොමිලේ ඉල්ලා සිටිය හැකිය. මෙම විස්තර පත්‍රිකාව අවසානයේ ඔබට සංවිධාන ලැයිස්තුවක් සොයාගත හැකිය.



අවශ්‍ය විටෙක, ඔබට වැටහෙන භාෂාවකින් කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදනය කිරීමට **භාෂණ පරිවර්තකයෙකු** ඔබට සහාය වනු ඇත. පරිවර්තකයා ඔබ පවසන කිසිවක් වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත.මෙම තොරතුරු අදාළ බලධාරීන් සමඟ ද හුවමාරු කර ගත හැකිය.

**රැකවරණ දේශසීමා ක්‍රියාපටිපාටිය අතරතුර පිළිගැනීම තුළ ඔබේ අයිතිවාසිකම් සහ වගකීම් මෙම විස්තර පත්‍රිකාව පැහැදිළි කරයි. රැකවරණ දේශසීමා ක්‍රියාපටිපාටිය තුළ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත සහ අනුගමනය කළ යුතු නීති පිළිබඳ තොරතුරු ඔබට වෙන වෙනම විස්තර පත්‍රිකාවලින් සොයාගත හැකිය.**

**ඔබ දැන් ඉතාලිය හි සිටින අතර, එය EU රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

## අවධානය පිණිසයි!

සියලුම EU+ රටවල අයදුම්කරුවන්ට සමාන පිළිගැනීමේ අයිතීන් සහ වගකීම් ඇත.

රැකවරණය සඳහා අයදුම් කිරීම සහ අනෙකුත් EU+ රටවලට ගමන් කිරීම සම්බන්ධව නීති පවතී.

බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, **ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි රැකවරණය සඳහා අයදුම් කර ඔබේ අයදුම්පත ලියාපදිංචි කළ යුතුය.**

**ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ එක් EU+ රටක් පමණි. ඉතාලිය** හි බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත සඳහා වගකිව යුතු EU+ රට තීරණය කිරීමට ක්‍රියාපටිපාටියක් අනුගමනය කරනු ඇත.

**ඔබ ඉතාලියතුළ රැඳී සිටිය යුතුය. බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබට වෙනත් EU+ රටකට ගමන් කළ නොහැක.** ඔබ ඉවත් ව ගියහොත්, සෘණාත්මක ප්‍රතිවිපාක ඇති වනු ඇත. ඉතාලිය තුළ ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නැවතෙනු ඇති අතර ඔබේ අයදුම්පත ඉල්ලා අස්කර ගත් ලෙස හෝ ප්‍රතික්ෂේප කළාක් ලෙස සැලකෙනු ඇත. අනෙක් රට තුළ ඔබේ ගමන් කිරීමේ නිදහස සීමා විය හැක, නැතහොත් රඳවා තබාගත හැකි අතර ඇතැම් පිළිගැනීමේ සේවා අවලංගු කෙරෙනු ඇත.

## ඔබ නැවතී සිටින්නේ කොහේද?

**පිළිගැනීමේ මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය හිමි, ජාත්‍යන්තර ආරක්ෂාව පිළිගැනීම පිළිබඳ ප්‍රාදේශීය කොමිසම විසින්, ඔබගේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත දේශසීමා ආශ්‍රිත රැකවරණ ලබා දීමේ ක්‍රියාපටිපාටිය යටතේ විමර්ශනය කළ යුතු බවට තීරණය කරනු ඇත.**

රැකවරණ දේශසීමා ක්‍රියාපටිපාටිය අතරතුර **ඔබ නිශ්චිත ස්ථානයක නැවතී සිටිය යුතුය.**

**ඔබ එම ස්ථානයේ නීති රීති අනුගමනය කළ යුතු අතර එම නිශ්චිත ස්ථානයේ ඔබේ පැමිණීම නිතිපතා පරීක්ෂා කළ හැකිය.**
එම මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය සම්බන්ධයෙන් භූගෝලීය අධිකරණ බලය හිමි පරිපාලන ඒකකය , නියමිත ස්ථානයක ඔබ රඳවා තැබීම පිළිබඳ තීරණය ගැන ඔබට ලිඛිතව - ඔබට අවබෝධ වන භාෂාවකින් - දැනුම් දිය යුතුය.






ඔබට නිශ්චිත ස්ථානයේ නැවතී සිටීමට වන තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

සුවිශේෂී අවස්ථාවන්හි දී ඔබට සීමිත කාලයක් සඳහා වෙනත් ස්ථානයක නැවතී සිටිය හැකිදැයි ඔබට බලධාරීන්ගෙන් [*අධිකාරියේ නම*] විමසිය හැකිය. බලධාරීන්ට ඔබේ ඉල්ලීම අනුමත කළ හෝ නොකළ හැකිය. ඔබේ ඉල්ලීම ප්‍රතික්ෂේප වුවහොත්, ඔබට මෙම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

## ඔබට ලැබෙන්නේ මොනවාද?

බලධාරීන් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ අයදුම්පත පරීක්ෂා කරන අතර, ඔබේ පුද්ගලික සහ මූල්‍ය තත්ත්වය මත පදනම් ව, ඔබට පහත දේ ලැබෙනු ඇත:



- නවාතැන්



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන



- ආහාර



- ඇඳුම් පැළඳුම්



- දෛනික වියදම් සඳහා මුදල්

## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය

ඔබට **අවශ්‍ය සෞඛ්‍ය සේවාව** ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත. මෙයට උදාහරණයක් ලෙස හෙදියක හෝ වෛද්‍යවරයෙකු හමුවීම, දරුණු රෝග සහ නිදන්ගත තත්වයන් සඳහා පරීක්ෂාව, වෛද්‍යවරයෙකු විසින් නියම කරන ලද ඖෂධ සහ මානසික සෞඛ්‍ය සහාය ඇතුළත් විය හැකිය.



**ඔබට වෛද්‍ය ගැටළුවක් තිබේ නම්, කාර්ය මණ්ඩලයට පවසන්න.**

ඔබට හදිසි වෛද්‍ය ආධාර හෝ හදිසි ප්‍රතිකාර අවශ්‍ය තුවාලයක් ඇත්නම්, කාර්ය මණ්ඩලයට පවසන්න.



ඔබට හෙදියක හෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වීමට සිදුවිය හැකිය. . ඔවුන් ඔබේ සෞඛ්‍යය පිළිබඳව පරීක්ෂා කර ඔබට සහාය වනු ඇත. ඔවුන් ඔබෙන් වර්තමාන හෝ අතීත රෝග, ඔබේ එන්නත් වාර්තා සහ ඔබ ගන්නා ඕනෑම ඖෂධයක් පිළිබඳව ප්‍රශ්න ඇසිය හැකිය.ඔබට ඇති විය හැකි ඕනෑම තුවාලයක්, වේදනාවක්, තත්ත්වයක් හෝ කරදර පිළිබඳව ද ඔවුන් ඔබෙන් ඇසිය හැකිය.

**ඔබට විශේෂ අවශ්‍යතා තිබේ නම්, විශේෂිත සහාය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.**

**කාර්ය මණ්ඩලයට දන්වන්න:**

- ඔබ අසනීප හෝ තුවාල ලබා සිටී නම්
- ඔබ ගැබ්ගෙන සිටී නම් ගැබ්ගෙන සිටිය හැකි නම්
- ඔබට විශේෂිත සහාය අවශ්‍ය පවුලේ සාමාජිකයන් සිටී නම්
- ඔබට ආබාධ තිබේ නම් (උදාහරණයක් ලෙස, සීමිත සංචලනය, ශ්‍රවණාබාධ, දෘශ්‍යාබාධිත වීම)
- ඔබට නිරන්තරයෙන් දුකක්, කනස්සල්ලක් දැනෙනවා නම්, ඔබට නිදාගත නොහැකි නම් හෝ ඔබට සෘණාත්මක සිතුවිලි තිබේ නම්
- ඔබ අතීත ප්‍රචණ්ඩත්වයෙන් හෝ වධහිංසාවලින් පීඩා විඳිනවා නම්
- ඔබට අනාරක්ෂිත බවක්, තර්ජනාත්මක බවක් දැනේ නම් හෝ යමෙකුට, ආගන්තුකයෙකුට හෝ ඔබ දන්නා පුද්ගලයෙකුට පවා බිය නම්
- ඔබට කිරීමට අවශ්‍ය නැති දේවල් කිරීමට ඔබට බල කර තිබේ නම් හෝ බල කරන්නේ නම්
- ඔබේ ඇඳහිල්ල, ඔබ ආදරය කරන අය, ඔබ අඳින පළඳින ආකාරය හෝ හැසිරෙන ආකාරය නිසා ඔබට අනාරක්ෂිත බවක් දැනේ නම්.

විශේෂිත සහාය ලබා දිය හැක්කේ කාර්ය මණ්ඩලය ඔබේ විශේෂ අවශ්‍යතා පිළිබඳව දන්නා විට පමණි.



- ඔබේ **විශේෂ අවශ්‍යතා** විනිශ්චය කිරීමට
- ඔබට වඩාත්ම සුදුසු **කුමන විශේෂිත සහාය ද යන්න** හඳුනා ගැනීමට

විශේෂිත කාර්ය මණ්ඩලය [*උදාහරණ ලෙස සමාජ සේවකයින්, මනෝ විද්‍යාඥයින් වැනි කාර්ය මණ්ඩලය නිශ්චිතව දැක්වීමට සාමාජික රටවලට අවශ්‍ය නම් ඔවුන්ට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට*] ඔබෙන් ප්‍රශ්න අසනු ඇත..



මෙය **විශේෂ අවශ්‍යතා පිළිබඳ ව අවදානම් තක්සේරුවක්** ලෙස හැඳින්වේ [*ජාතික නිශ්චිත පාරිභාෂිතය සමඟ තෝරන්න හෝ අවශ්‍ය පරිදි වෙනස් කරන්න*].

අවශ්‍ය නම්, ඔබට වැටහෙන භාෂාවකින් සන්නිවේදනය කිරීමට පරිවර්තකයෙකු ඔබට උපකාර කරනු ඇත.



ඔබට විශේෂිත සහාය අවශ්‍ය නම්, **සෑම විටම කාර්ය මණ්ඩලය සම්බන්ධ කරගන්න.**

බලධාරීන් ඔබට අවශ්‍යතාවයක් ඇතැයි සලකන තාක් කල් ඔබට මෙම සහාය ලැබෙනු ඇත.

ඔබට වෛද්‍යවරයා, හෙදිය සහ විශේෂිත කාර්ය මණ්ඩලය විශ්වාස කළ හැකි අතර ඔවුන් සමඟ නිදහසේ කතා කළ හැකිය. සියලුම තොරතුරු රහසිගතව තබා ගනු ඇත, එනම් ඔබේ එකඟතාවයකින් තොරව ඒවා අන් අය සමඟ බෙදා නොගනු ඇත.

එය එසේ නොවන්නේ ඔබේ හෝ වෙනත් කෙනෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇති අවස්ථාවක පමණි.

## දරුවන්ට අධ්‍යාපනයට ඇති අයිතිය

වයස අවුරුදු 18 ට අඩු සියලුම ළමුන්ට, පිරිමි ළමුන්ට සහ ගැහැණු ළමුන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත.

ඔවුන්ට භාෂා පන්ති වැනි සහාය ලැබෙනු ඇත.



**දෙමාපියන්ට තම දරුවන් පාසල් යැවීම සඳහා වගකීමක් ඇත.**

**ඉතාලියේදී, වයස අවුරුදු 6ත් 16ත් අතර සියලුම බාලවයස්කරුවන් පාසල් යා යුතුය.**

## ඔබ කොතැනක නැවතී සිටියත්, ඔබට ඇති වෙනත් අයිතීන් මොනවාද?



- **සුරක්ෂිත වීමට:** කාර්ය මණ්ඩලය ඇතුළු කිසිවෙකුට ඔබට තර්ජනය කිරීමට, අපහාස කිරීමට හෝ හානි කිරීමට අවසර නැත.



- **ඔබේ සැමියා, බිරිඳ, දරුවන් සහ වයස අවුරුදු 18 ට අඩු සහෝදර සහෝදරියන් සමඟ හෝ දෛනික රැකවරණය අවශ්‍ය වැඩිහිටි ඥාතියෙකු සමඟ නැවතී සිටීමට**
- ඔබ දෛනික රැකවරණය අවශ්‍ය වැඩිහිටියෙකු නම්**, ඔබේ ඥාතීන් සමඟ නැවතී සිටීමට.**



- ඔබේ පවුලේ අය සමඟ **සන්නිවේදනය කිරීමට** සහ **ඔවුන් සිටින ස්ථානය ඔබ නොදන්නේ නම්, ඔවුන් සොයා ගැනීමට** උපකාර ලබා ගැනීමට.

**ඔබ මෙසේ විශ්වාස කරන්නේ නම්, ඔබට විධිමත් පැමිණිල්ලක් කළ හැකිය:**



- කාර්ය මණ්ඩලයේ කිසිවෙකු ඔබට තර්ජනය, අපහාස හෝ හානි සිදු කර ඇත.

විධිමත් පැමිණිල්ලක් සිදු කරන ආකාරය බලධාරීන් ඔබට දන්වනු ඇත.

ඔබට සැමවිටම බලධාරීන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් හෝ එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයෙන් (UNHCR) වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකිය.

**අවධානය පිණිසයි!** මෙම නිශ්චිත ස්ථානයේ නැවතී සිටීමට ගත් තීරණයට සහ පනවා ඇති සීමාවන්ට ඔබ ගරු නොකරන්නේ නම් සහ ඔබ නැවත පලා යාමේ අවදානමක් තිබේ නම්, ඔබව රඳවා තබා ගත හැකිය.

## අයදුම්කරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථා

රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ ඔබට නිදහසේ පිටව යා නොහැකි නිශ්චිත පහසු ස්ථානයක ඔබව තබා ඇති බවයි. ඔබව රඳවා තබා ගැනීමට බලධාරීන්ට වලංගු හේතුවක් තිබිය යුතුය. ඔබේ තත්ත්වයේ දී වෙනත් විකල්පයක් කළ නොහැකි බවට ඔවුන් සහතික විය යුතුය. බලධාරීන් තීරණය කිරීමට පෙර ඔබේ පුද්ගලික තත්ත්වය පිළිබඳව සලකා බලනු ඇත.



රඳවා තබා ගැනීමට හේතු විය හැක්කේ, උදාහරණයක් ලෙස:

- රඳවා තබා ගැනීමකින් තොරව ඔබේ රැකවරණ අයදුම්පතෙහි වැදගත් අංග (උදාහරණයක් ලෙස ඔබේ අනන්‍යතාවය) සත්‍යාපනය කළ නොහැකිය
- ඔබ නිශ්චිත ස්ථානයක නැවතී සිටීමේ වගකීමට ගරු නොකළ අතර, ඔබ නැවත පලා යාමේ අවදානමක් ඇත, එමෙන්ම බලධාරීන්ට ඔබ වෙත ළඟා විය නොහැකිය
- ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු EU + රටට මාරු කිරීමට ඔබට තීරණයක් ලැබී ඇති අතර මාරුවීමට පෙර ඔබ පලා යාමේ අවදානමක් ඇත
- ඔබ ආරක්ෂක අවදානමක් ඇති බව පෙන්වයි.

ඔබව රඳවා තබාගෙන සිටී නම්, ඔබට තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ඔබට නොමිලේ නීති සහාය සහ නියෙෝජනය ඉල්ලා සිටිය හැකිය.

# ඔබට පිළිගැනීම තුළ ඇති වගකීම් මොනවාද?





**ඔබ ඉටු කළ යුතු වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.**

- ✓ මේ රටේ නීති පිළිපදින්න.
- ✓ තුළ නැවතී සිටින්න සහ බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් නොකරන්න.
- ✗ අවසරයකින් තොරව බලධාරීන් ඔබ නැවතී සිටිය යුතු බව පැවසූ නිශ්චිත ස්ථානයෙන් පිටව නොයන්න.
- ✓ බලධාරීන සමඟ සම්පූර්ණයෙන්ම සහයෝගයෙන් කටයුතු කරන්න සහ ඔවුන්ගේ උපදෙස් අනුගමනය කරන්න.
- ✓ ඔබ නැවතී සිටින ස්ථානයේ නීතිරීතිවලට ගරු කරන්න.
- ✓ අනෙකුත් පදිංචිකරුවන්ට, කාර්ය මණ්ඩලයට සහ අනෙකුත් පුද්ගලයින්ට ගරු කරන්න.
- ✓ ඔබේ වත්මන් ලිපිනය සහ සම්බන්ධතා තොරතුරු (දුරකථන අංකය, ඊමේලය) පිළිබඳව බලධාරීන්ට දැනුම් දෙන්න, එවිට ඔවුන්ට සැමවිටම ඔබව සම්බන්ධ කර ගත හැකිය.

## ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?

බලධාරීන් ඔබේ තත්වය ඇගයීමට ලක් කරනු ඇති අතර යම් ආකාරයේ සහායන් පහත හෙළීමට හෙෝ අවලංගු කිරීමට තීරණය කළ හැකිය. බලධාරීන් එවැනි තීරණයක් පිළිබඳ ව ලිඛිතව ඔබට දන්වනු ඇති අතර ඔවුන් පහත හෙළන්නේ හෙෝ අවලංගු කරන්නේ කුමන සහායද යන්න සඳහන් කරනු ඇත.



### අවධානය පිණිසයි!

**ඔබට අඩු සහායක් ලැබිය හැකිය,** උදාහරණයක් ලෙස:

- ඔබ අවසරයකින් තොරව බලධාරීන් ඔබ නැවතී සිටිය යුතු බව පැවසූ නිශ්චිත ස්ථානයෙන් පිටව යන්නේ නම්
- ඔබ බලධාරීන් සමඟ සහයෙෝගයෙන් කටයුතු නොකරන්නේ නම්
- ඔබ ඔබේ මූල්‍ය සම්පත් පිළිබඳ ව සත්‍ය නොපවසන්නේ නම්
- ඔබ නැවතී සිටින ස්ථානයේ නීති කඩ කරන්නේ නම
- ඔබ අනිවාර්ය පාඨමාලා සඳහා සහභාගී නොවන්නේ නම්
- ඔබ අවසරයකින් තොරව මෙම රටින් පිටව ගොස් ඇති අතර ඔබව මෙම රටට ආපසු එවා තිබේ නම්
- ඔබ දැනටමත් වෙනත් EU+ රටක රැකවරණය සඳහා ඉල්ලුම් කර ඇති අතර ඔබ එම රටින් පිටව ගොස් තිබේ නම්.


ඔබ ප්‍රචණ්ඩකාරී නම්, අන් අයට තර්ජනය කරන්නේ නම් හෙෝ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති නැවත නැවතත් හෙෝ බරපතල ලෙස කඩ කරන්නේ නම් **ඔබට ලැබෙන සහාය අහිමි විය හැකිය.** මෙම අවස්ථාවේ දී, මැදිහත් වීමට පොලිසිය ද කැඳවිය හැකිය.



**අවධානය පිණිසයි!** ඔබ නිශ්චිත ස්ථානයේ නැවතී සිටීමට ඇති වගකීම සහ පනවා ඇති සීමාවන්ට ගරු නොකරන්නේ නම් සහ ඔබ නැවත පලා යනු ඇතැයි බලධාරීන් බිය වන්නේ නම්:

- ඔබව රඳවා තබා ගත හැකිය
- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නැවතෙනු ඇති අතර ඔබේ අයදුම්පත ඉල්ලා අස්කර ගත් ලෙස හෝ ප්‍රතික්ෂේප කළාක් ලෙස සැලකෙනු ඇත. මෙයින් අදහස් වනේ ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු ලෙස ඔබේ තත්ත්වය සහ ඒ ආශ්‍රිත සියලු අයිතිවාසිකම් අහිමි විය හැකි බවයි.

## බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබ වෙනත් EU+ රටකට ගමන් කළහොත් කුමක් සිදුවේද?




**ඉතාලියෙහි:**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නැවතෙනු ඇති අතර ඔබේ අයදුම්පත ඉල්ලා අස්කර ගත් ලෙස හෝ ප්‍රතික්ෂේප කළාක් ලෙස සැලකෙනු ඇත.

**ඔබ අවසරයකින් තොරව ගමන් කළ EU+ රටෙහි:**

- ඔබ අවසරයකින් තොරව හැර ගිය රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් ඔබව ආපසු යැවීමේ තීරණය පිළිබඳව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට **බොහෝ සේවාවන් සහ ඇතැම් ආකාරයේ සහායන්** නොලැබෙනු ඇත
- ඔබට **රැකියාවක නිරත වීමට** අවසර නොලැබෙනු ඇත
- ඔබට **භාෂා පාඨමාලා හෝ නව කුසලතා ඉගෙන ගැනීමේ පාඨමාලා සඳහා සහභාගී වීමට අවසර නොලැබෙනු ඇත**

## ඔබට අධිකාරියේ තීරණයකට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය



අයදුම්කරුවෙකු ලෙස ඔබේ අයිතීන් සීමා කිරීමට බලධාරීන් තීරණය කරන්නේ නම් සහ එය අසාධාරණ යැයි ඔබ විශ්වාස කරන්නේ නම්, **ඔබට එම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.**

ප්‍රාදේශීය පරිපාලන අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔබට හැකියාව ඇත්තේ, ප්‍රාන්ත පරිපාලනය  යම් තීරණයක් ගන්නේ නම්:

- ඔබට ලබා දෙන පිළිගැනීමේ සහාය පහත හෙළීමට හෝ අවලංගු කිරීමට
- තාවකාලිකව නිශ්චිත ස්ථානයකින් ඉවත් වීමට වන ඔබේ ඉල්ලීම අනුමත නොකිරීමට
- ඔබ නිශ්චිත ස්ථානයක නැවතී සිටීමට බැඳී සිටියි

*අවම වශයෙන් අවසාන අවස්ථාවේ දී අධිකරණ අධිකාරියක් ඉදිරියේ අභියාචනය ගොනු කරන අවස්ථා*

ඔබ බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් කර එහි යම් පිළිගැනීමේ අයිතීන් ඔබට අහිමි වුවහොත්, ඔබට මෙම තීරණයට එම රට තුළ අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

16 වන පිටුවේ පැහැදිළි කර ඇති තත්ත්වයන් හේතුවෙන් හි බලධාරීන් ඔබට ලබා දෙන පිළිගැනීමේ සහාය පහත හෙළීමට හෝ අවලංගු කිරීමට තීරණය කරන්නේ නම්, ඔබට යම් අයිතීන් තිබෙනු ඇත. උදාහරණයක් ලෙස, ඔබට වෛද්‍යවරයෙකු හෝ හෙදියක හමුවීමට, වෛද්‍ය ආධාර ලබා ගැනීමට, යම් සහායක් ලබා ගැනීමට සහ බලධාරීන් විසින් තීරණය කරන ලද පරිදි ඔබට නිදා ගැනීමට ස්ථානයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

ඔබට ලැබෙන සහායේ ආකාරය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

ඔබ අවසරයකින් තොරව ගමන් කළ වෙනත් EU+ රටක බලධාරීන් ඔබට ලබා දී ඇති පිළිගැනීමේ සහාය අවලංගු කිරීමට තීරණය කළ විට, ඔබට තවමත් ලැබෙන සහායේ ආකාරය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

## ඔබට නීතිමය සහාය ලැබිය හැකිය



ඔබේ පිළිගැනීමේ අයිතිවාසිකම් විනිසුරුවරයෙකු ඉදිරියේ සීමා කිරීමට බලධාරීන් ගත් තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔබට අවශ්‍ය නම්, ඔබේ තත්වය අනුව [*සාමාජික රටට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට*] ඔබට නොමිලේ නීති සහාය සහ නියෝජනය ලැබෙනු ඇත/ලැබිය හැකිය [*තෝරන්න*].

මෙයින් අදහස් වන්නේ නීති උපදේශකයෙකු හෝ නීතිඥයෙකු ඔබට උපකාර කරනු ඇති බවයි. නීති උපදේශකයින් හෝ නීතිඥයින් විනිසුරුවරයෙකු ඉදිරියේ ඔබට නීතිමය සහාය ලබා දෙයි, ඔබේ අභිරුචිය ආරක්ෂා කරයි සහ ඔවුන් බලධාරීන්ගෙන් සහ විනිසුරුවරයාගෙන් ස්වාධීන වේ.

ඔබට ඔබේම වියදමින් නීති උපදේශකයෙකුගෙන් හෝ නීතිඥයෙකුගෙන් උපදෙස් ලබා ගත හැකිය.




තීරණයකට අභියාචනා කරන ආකාරය බලධාරීන් ඔබට දන්වනු ඇත.

ගාස්තුවකින් තොර නීති ආධාර සහ නියෝජනය ඇතුළුව වැඩිදුර තොරතුරු ඔබට සැමවිටම බලධාරීන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් හෝ UNHCR වෙතින් ඉල්ලා සිටිය හැක.

euaa
EUROPEAN UNION
AGENCY FOR ASYLUM

MINISTERO
DELL'INTERNO

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025